M 474

# ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ විනය ගැටලු විග්‍රහ කිරීම සහ ඒවා විසඳීමට ගතයුතු පියවර පිළිබඳ බස්නාහිර පළාත ආශ්‍රයෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

UNIVERSITY OF COLOMBO, SRI LANKA
26 MAY 2005
LIBRARY

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ කෘතියයි.

University of Colombo Library Sri Lanka
UCLIB
525872

2003.06.01

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
කොළඹ 03

එස්.ජේ.පී. විජේසිංහ
B.Sc. (ගණිත විශේෂ)
Diploma in Education
M.Ed (කොළඹ විශ්වවිද්‍යාලය)

# සාරාංශය

සිසු විනය පිරිහීම පාසල් පද්ධතිය තුළ වර්තමානයේ බලපවත්වන විශාලතම ප්‍රශ්නය බවට පත්ව ඇත. සිසු විනය සම්බන්ධයෙන් මෙතෙක් ශ්‍රී ලංකාවේ සිදුකර ඇති පර්යේෂණ ඉතා අල්පය. මේ ගැන පර්යේෂණ සිදුකිරීම තුළින්, වර්තමාන පාසල් පද්ධතිය තුළ කෙතෙක් දුරට සිසු විනය පවතීද, ඒ සම්බන්ධ මතුවන ගැටලු කවරේද, ඒවාට මෙතෙක් දී ඇති විසඳුම් කවරේද, එම විසඳුම්වල ඵලදායීතාව කෙතෙක් ද ආදී වශයෙන් කරුණු සොයා බැලිය හැක. මේ සියලු කරුණු සලකා බැලීම තුළින් සාර්ථක විනය කළමනාකරණයක් සිදුකළ හැක්කේ කෙසේද යන්න විමසා බැලිය හැක. මෙසේ කාලෝචිතයයි සැලකිය හැකි බැවින් ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ විනය ගැටලු විග්‍රහ කිරීම සහ ඒවා විසඳීමට ගතයුතු පියවර පිළිබඳ බස්නාහිර පළාත ආශ්‍රයෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් ලෙස මෙම පර්යේෂණ කෘතිය ඉදිරිපත් කෙරේ. විනය යන්න පිළිබඳ අර්ථ දක්වීම් භාවිතයට ගනිමින් සිසුන්ගේ විනය ගැටලු හඳුනා ගැනීමත් එම විනය ගැටලු අතරින් වර්තමානයේ පාසල් පද්ධතිය තුළ වඩාත්ම බහුල විනය ගැටලු ගැන සොයා බැලීමත් මෙම පර්යේෂණය තුළින් සිදුවේ. සොයාගත් විනය ගැටලු වර්ගීකරණයකට ඇතුළත් කරන අතර මෙම විනය ගැටලු ඇතිවීමට බලපාන සාධක හඳුනාගැනීම හා මැඩ පැවැත්වීමට ගුරුවරුන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග ද අධ්‍යයනයට පාත්‍ර විය.

විනය සකස් කිරීමට සැකසූ අධ්‍යාපන නීතියේ ප්‍රවණතා සලකා බැලෙන අතර විනය සකස් කිරීමට තුඩුදෙන ව්‍යවස්ථා හා චක්‍රලේඛ ගැනද එසේම විනය සම්බන්ධයෙන් මතුවූ නඩු තීන්දු ද අධ්‍යයනයට හසුවේ. කායික දණ්ඩනය ලෝකයේ විවිධ රටවල් කොතෙක් දුරට ප්‍රතික්ෂේප කර ඇත්ද යන්නත් ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ මතද සලකා බලන ලදී. බස්නාහිර පළාතේ 1AB පාසල් 7ක්, 1C පාසල් 3 ක් හා 2 වර්ගයේ පාසල් 2ක් දිස්ත්‍රික්ක තුනෙන්ම ඇතුළත් වන පරිදි තෝරාගත් නියැදියක් මෙම පර්යේෂණයට යටත් විය. එම පාසල්වල සිසුන්, ගුරුමණ්ඩල හා විදුහල්පතිවරුන් සඳහා සකස් කරන ලද ප්‍රශ්නාවලී මගින් ඒවායේ වර්තමාන විනය තත්ත්වය ගැන සොයා බැලීම සිදු කෙරිණ. ඒ යටතේ ගුරුවරුන් 30 දෙනෙකුට දෙන ප්‍රශ්නාවලියක් තුළින් ඒවායේ සිදුවී ඇති විනය ගැටලු කවරේද යන්නත්, එම විනය ගැටලු අතරින් වඩාත්ම බහුලව සිදුවන විනය ගැටලු හඳුනාගැනීමත් සිදුකරන ලදී. විනය ගැටලු ඇතිවීමට බලපෑ හැකි සාධක ගැනත් විනය ගැටලු වැලැක්වීම සඳහා කෙතෙක් දුරට ක්‍රියාමාර්ග ගෙන ඇත්ද යන්නත් එම ක්‍රියා මාර්ගවල ඵලදායීතාවය ගැනත්, අලුතින් හඳුන්වා දියයුතු ක්‍රියාමාර්ග ගැනත් සොයා බැලීම සඳහා සිසුන්ට, ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට ප්‍රශ්නාවලි ඉදිරිපත් කෙරිණ. පාසල් වර්ග අනුව පුරුෂ/ස්ත්‍රී ග්‍රාමීය/නාගරික සිසුන් 2500 ට වැඩි 1AB පාසල් හා සිසුන් 1000 ට අඩු 1C හා 2 ආදී වශයෙන් පාසල් කාණ්ඩ තුළ විනය සම්බන්ධයෙන් වැදගත් වන කරුණු කීපයක් සංසන්දනය කරන ලදී. සිසුන්. දෙමාපියන්, ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ ඉහළ අධ්‍යාපනඥයින් සමග සාකච්ඡා කර ලබාගත් තොරතුරුත්, උපකරණ ලෙස සකස් කළ ප්‍රශ්නාවලී 5ක් යටතේ ලබාගත් තොරතුරුත් පොත්පත් හා අන්තර් ජාලය සම්බන්ධ කර ලබාගත් මෙරට හා වෙනත් රටවල තොරතුරුත් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ විනය ගැටලු විසඳීමට/ඇතිවීම වැළැක්වීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

# Summery

Deteriorating the discipline of students in the school system has become the greatest problem at present. It is also a fact that the experiments and researches that have been carried out in this regard are very few. These experiments and researches enable us to find out the productivity of discipline in schools, the problems that crop up when implementing rules and regulations, the solutions to overcome some of the disciplinary problems and the effectiveness of those solutions. By examining all these factors we can consider a successful disciplinary management in schools. This thesis is presented with the intention of its timely need and it contains the information gathered from the researches done about the disciplinary problems in schools and the solutions that can be taken based on the schools in the Western Province. This experiment is carried out to find out the disciplinary problems in schools and identify the most common disciplinary problems out of them by taking the definitions of discipline. The disciplinary problems which have been found out will be categorized with the reasons and the solutions that the teachers have been taken to overcome them in this study. The tendencies which are liable in the Educational Law, the constitution and the circulars which affect maintaining discipline and the problems arose when giving judgements regarding discipline are also taken into consideration in this study. How far the various countries in the world have rejected the corporal punishment and the arguments for and against this in Sri Lanka too are considered.

Seven 1 AB schools, three 1C schools and two 2nd category schools were taken from three districts in the Western Province as a sample in this experiment Questionnaires prepared for Principals, Staff and Students were distributed in order to find out the present state of discipline. From this selected group of thirty teachers the disciplinary problems which have been taken place and out of them the most common disciplinary problems were identified. Questionnaires containing the reasons affecting the disciplinary problems, the necessary steps that have been taken to avoid such problems, the productivity of these remedies and the new methods that should be introduced were distributed among the students, teachers and principals. Some of the key factors regarding discipline were compared by taking more than 2500 students from 1AB, 1000 each from 1 C and two under the categories of male/female and rural/urban. The suggestions to solve the disciplinary problems among the students and to avoid them are stated from the information collected by the discussions held with the students, parents, principals and prominent educationists and the information under five questionnaire on instrumental basis and also the information about Sri Lanka and other countries which was taken from books and internet.